3.i.පහත දැක්වෙන වචනවල තේරුම ලියන්න.

i. පරුමක
ii. වැව් ප්‍රපතනය
iii. මපුරුමුතා (ලකුණු 03)

ii.රාජ්‍යත්වය සම්බන්ධ සංකල්ප හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii.ගමිකයන්ගෙන් ඉටු වූ කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ දේශපාලන හා ආගමික සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

4.i.ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

ii.පුරාණ කාලයේ මෙරට පැවති පාලනයේ මූලික අරමුණු මොනවා ද? (ලකුණු 04)

iii.පුරාණ සමාජයේ වාර්ගික සයජීවනය කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.අතීත සමාජයේ ආර්ථික රටාව කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 06)

5.i.වැවක පහත සඳහන් කොටස්වලින් ඉටුවන කාර්යය අනුපිළිවෙලින් ලියන්න.

i. වැව් බැම්ම
ii. රළපනාව
iii. බිසෝකොටුව

(ලකුණු 03)

ii.පැරණි වෛද්‍ය ශාස්ත්‍රයේ දියුණුව සඳහා සාධක දෙකක් දක්වන්න. (ලකුණු 04)

iii.පූර්ව ඓතිහාසික යුගයේ විද්‍යාවේ පරිණත බව පෙන්නුම් කරන අවස්ථා දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv."අතීත ශ්‍රී ලාංකිකයෝ ඉතා විශිෂ්ඨ වූ වාරි තාක්ෂණයකට හිමිකම් පෑහ." මෙය කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 06)

6. i.අතීත සමාජයේ ප්‍රභූත්වයේ ලා සලකන ලද වෘත්තීන් තුනක් නම් කරන්න (ලකුණු 03)

ii. සෙල්ලිපි වල කුඩීන් ලෙස හැඳින්වූ සමාජ පංතිය නියෝජනය කල කණ්ඩායම් හතරක් ලියන්න (ලකුණු 04)

iii.පැරණි කාලයේ ශ්‍රී ලංකීය කාන්තාවට සමාජයේ නිසිතැන ලැබුණු බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 05)

iv.යහපත් සමාජයක් පවත්වාගෙන යාමට අතීත සමාජයේ නීතියේ දායකත්වය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න (ලකුණු 06)

7. i.ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල වූ දකුණු ඉන්දියාවේ ප්‍රදේශ තුනක් නම් කරන්න (ලකුණු 03)

ii.මහා පරාක්‍රමබාහු රජතුමා වෙළඳ සබඳතා පැවැත්වූ අග්නිදිග ආසියානු රටවල් දෙකක් නම් කරන්න (ලකුණු 04 )

iii.දඹදෙණි යුගයේ ශ්‍රේෂ්ඨ පාලකයා වූ තුන්වන විජයබාහු රජතුමාගේ වැදගත්කම කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න (ලකුණු 05)

iv.සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්වීමට පසුබිම් වන සාධක තුනක් විස්තර කරන්න (ලකුණු 06)

8. i.පොලොන්නරුව පාලනය කල ශ්‍රේෂ්ඨ රජවරුන් තිදෙනා පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03)

ii.දෙවන නාගරීකරණ ක්‍රියාවලියේ දී බිහිවූ නගර ඊට පෙර පවති නාගරීකරණයෙන් වෙනස් වන ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු04 )

iii.පොලොන්නරුව රාජධානියේ බිඳවැටීමට පසුබිම් වූ සාධක දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.හයවන පරාක්‍රමබාහු රජතුමාගේ වැදගත්කම කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 06)

The National e-learning Portal for The General Education

මුස්ලිම් පාසල් සඳහා උපදෙස්

- ❖ මුස්ලිම් පාසල් සිසුන් සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේ දී ප්‍රශ්න අංක 9 , 10 ද තෝරා ගන්න.
- ❖ පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

9. i.උඩරංචාමඩම කැනීම් මඟින් පැරණි නිවසින් හමුවූ ද්‍රව්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii.ඉන් අපට එළැඹිය හැකි නිගමන දෙකක් සඳහන් කරන්න. (ලකුණු04 )

iii.ප්‍රාග් ඓතිහාසික මානවයා තම වාසස්ථාන තෝරා ගැනීමේදී සැලැකිලිමත් වූ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු05)

iv.අනුරාධපුරය සැලසුම් සහගත නගරයක් බවට පත් කිරීමේදී පණ්ඩුකාභය රජතුමා විසින් සැලැකිලිමත් වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

10. i.වසභ රජතුමාගෙන් ඉටුවූ සේවාවන් තුනක් ලියන්න. (ලකුණු03)

ii.අතීතයේ මෙරට රාජ්‍යත්වයේ උරුමය හිමිවූ ආකාරයන් දෙකක් නම් කරන්න. (ලකුණු04 )

iii.දේවානම්පියතිස්ස රජතුමාගේ සමයේ මෙරට සිදු වූ වැදගත් ආගමික සිදුවීම් දෙකක් දක්වා ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv."මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු අතර මහා විජයබාහු රජතුමා සුවිශේෂී වේ."එතුමාගෙන් ඉටුවූ දේශපාලන සේවාවන් පිළිබඳ කරුණු දෙකක් ඔස්සේ විස්තර කරන්න (ලකුණු 06)

The National e-learning Portal for The General Education



The National e-Learning Portal for The General Education



The National e-Learning Portal for The General Education